ශ්‍රේණිය : 10 ශ්‍රේණිය

විෂය : නර්තනය

නිපුණතාවය : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

නිපුණතා මට්ටම : 6.3.1 ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය නරඹා විචාරයට ලක් කරයි.

සැකසුම : ඩබ්ලිව් එම් දනුෂිකා දුලජනී කුමාරි VPA(Special)



# කූඹි කතාව

විඩියෝව නැරඹීම සඳහා

https://www.youtube.com/watch?v=XP0MtDHZzZM



රංග රචනය : අංජලිකා චිත්‍රසේන

අධ්‍යක්ෂණය : හෙෂ්මා විග්නරජා

පිටපත : ටානියා බැරකෝමා

කලා කටයුතු හා රංග

වස්ත්‍රාභරණ නිර්මාණය : මහේෂ් උමගිලිය


සංගීතය : රොබට් ජුලියන්හි ඇතුළු පිරිස




සැකසුම : ඩබ්ලිව් එම් දනුෂිකා දුළජ්නි කුමාරි

# කූඹි කතාව

2007 වසරේදී නිෂ්පාදනය වූ “**කූඹි කතාව**” ළමා මුද්‍රා නාට්‍යය ටැටියානා මකරෝවා (Tatiana Makarova) විසින් රචිත “වීර කුහුඹුවා” (The brave Ant) නම් රුසියානු ළමා කතාව ඇසුරෙන් ආභාෂය ලැබූවකි.



# කතා පුවත

කූඹීහු තම රාජධානියේ එදිනෙදා කටයුතුවල නිරත වෙති. විවිධ කුහුඹු පවුල් එහි වාසය කරමින් කුහුඹු රැජිනගේ අණට අනුව කටයුතු කරති. රෙදි විවීම,රෙදි සේදීම,කෑම පිසීම,පිරිසිදු කිරීම මොවුන්ගේ කාර්යයෝය.

දිනක් කුහුඹු පවුලක් තම රාජ්‍යයෙන් ඈතට කෑම සෙවීම සඳහා පිටත් වේ. මේ අතරතුර මදුරුවෙක් පැමිණේ. කුහුඹින්ගෙ නිවාස කඩා බිඳ දමයි. කුහුඹින් නැවත එනවිට එන විට දක්නට ලැබුණේ ඒවා විනාශ වී ඇති බවයි. ඔවුහු එකමුතුව නැවත රාජ්‍යය ගොඩනැගූහ. ඉන්පසුව තම අසල්වැසි යහලුවන්ට තේ පැන් සංග්‍රහයක් සූදානම් කලහ එම සාදයට තණකොළ පෙත්තෝ,කුරුමිණියෝ හා සමනලයෝ පැමිණෙති.

සාදය ජයට පවතින විට සුළඟ සමග වැස්සක් විත් මුළු ප්‍රදේශයම ජලයෙන් යටවෙයි. පියාපත් ඇති අය ඉගිලී ගෙන යති. කුහුඹුවෝ හා අනිකුත් අය අය ටින් එක උඩට නැගී බලා හිඳිති. පණ බේරා ගැනීමට දඟලන මදුරුවා ද කුහුඹින් විසින් බේරා ගනු ලැබේ.

සැකසුම : ඩබ්ලිව් එම් උනෂිකා දුලප්නී කුමාරි

# රංග වස්ත්‍රාභරණ

- රංග වස්ත්‍රාභරණ නිර්මාණයේ දී එක් එක් සත්ව චරිත සඳහා උචිත අයුරින් වර්ණ භාවිතය කැපී පෙනෙයි.
- කුහුඹු රැජින,මදුරුවා,පළඟැටියන්,කුරුමිණියන් ආදී චරිතයන් නිරූපණයේ දී වඩාත් නිර්මාණශීලීව චරිත ලක්ෂණ විදහා දැක්වෙන අයුරින් රංග වස්ත්‍ර නිර්මාණය කර ඇත.
- තේ පෝච්චිය හා පීරිසි කෝප්ප සඳහා රංග වස්ත්‍රාභරණ නිර්මාණයේදී ඉන්දියානු මනිපුරි නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍ර වල යම් ආභාෂයක් ලබා ඇති බව දක්නට ලැබේ.

# පසුබිම් අලංකරණ

- නවීන තාක්ෂණය ද උපයෝගී කරගනිමින් පසුබිම් අලංකරණ යොදා ගෙන ඇත.
- විදුලි ආලෝකකරණය ද විශිෂ්ට අයුරින් භාවිත කොට ගෙන ඇති බව දක්නට ලැබේ.
- ප්‍රදේශය ගංවතුරින් යට වෙන අවස්ථාව වඩාත් නිර්මාණශීලීව මතු කර දක්වයි.

සැකසුම : ඩබ්ලිව් එම් දනුෂිකා දුලජනී කුමාරි

# කාර්ය පත්‍රිකාව

01 - කුම්භී කතාව මුද්‍රා නාට්‍යයේ කථා පුවත කෙටියෙන් ලියා දක්වන්න.

02 - මෙම මුද්‍රා නාට්‍යය තුළින් සමාජයට ලබාදෙන ආදර්ශයන් පිළිබඳ උදාහණ දෙමින් කෙටි හැඳින්වීමක් කරන්න.

03 - කුම්භී කතාව මුද්‍රා නාට්‍යයෙන් ඔබ ජීවිතයට ගත හැකි යහපත් ගුණාංග පහක් ලියන්න.

සැකසුම : ඩබ්ලිව් එම් දනෂිකා දුලජනී කුමාරි